# ඉස්ලාම් ගැන නිතර අසන ප්‍රශ්න: ශබ්දකෝෂයෙන් තෝරාගත් ප්‍රශ්න.

# (මැවීම පිළිබඳ කොටස)

-300355-44470600

ප්‍රශ්න අංක: 16

## ජීවිතය ආරම්භ වූයේ කෙසේ ද?

පිළිතුර:

වැදගත් කරුණ (1)

ප්‍ර- මැවීම් ආරම්භ වූයේ කෙසේ ද?

පි: සැබැවින්ම උත්තරීතර අල්ලාහ් විය. ඔහුට පෙර කිසිවක් නොවීය. විශ්වය ශුන්‍ය තත්ත්වයේ තිබී, පසුව පූර්ණ ලෙස අල්ලාහ් ඔහුගේ මැවීම බිහි කළේය. සුවිශුද්ධ උත්තරීතර අල්ලාහ් එය බිහි කළේ කිසිදු පූර්වාදර්ශයකින් තොරව ය. උත්තරීතරයාණන් මෙසේ පවසයි:﴿ إِنَّ رَبَّكُمُ ٱللَّهُ ٱلَّذِى خَلَقَ ٱلسَّمَٰوَٰتِ وَٱلْأَرْضَ فِى سِتَّةِ أَيَّامٍ ثُمَّ ٱسْتَوَىٰ عَلَى ٱلْعَرْشِ يُغْشِى ٱلَّيْلَ ٱلنَّهَارَ يَطْلُبُهُۥ حَثِيثًا وَٱلشَّمْسَ وَٱلْقَمَرَ وَٱلنُّجُومَ مُسَخَّرَٰتٍۭ بِأَمْرِهِۦٓ ۗ أَلَا لَهُ ٱلْخَلْقُ وَٱلْأَمْرُ ۗ تَبَارَكَ ٱللَّهُ رَبُّ ٱلْعَٰلَمِينَ﴾ "නියත වශයෙන්ම අහස් හා මහපොළොව දින සයකින් මැව්වේ නුඹලාගේ පරමාධිපති වන අල්ලාහ්ය. පසුව ඔහු අෂ්ර්ය මත වූයේය. ඔහු රාත්‍රියෙන් දහවල ආවරණය කරයි. මෙය (දහවල) එය (රාත්‍රිය) සීඝ්‍රයෙන් සොයයි. තවද හිරු සඳු හා තරු ඔහුගේ නියෝගය අනුව වසඟ කරනු ලැබූ දෑ වෙති. දැන ගනු. මැවීම් හා නියෝගය ඔහු සතුය. සකල ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ් උත්කෘෂ්ට විය."(අල්-අඃරාෆ්: 54)නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැවසූ බව ඉම්රාන් ඉබ්නු හුසෙයින් තුමා විසින් වාතර්‍රා කළ හදීසයක් තම සහීහ් ග්‍රන්ථයේ බුහාරි තුමා මෙසේ වාතර්‍රා කරයි.අල්ලාහ් විය. ඔහුට පෙර කිසිවක් නොවීය. ඔහුගේ රාජාසනය ජලය මත විය. පසුව ඔහු අහස් හා මහපොළොව මැව්වේය. සෑම කරුණක්ම පුස්තකයේ සටහන් කළේය.

මිනිස් පියා ආදම් ව අල්ලාහ් මැව්වේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාතර්ා කළ හදීසයක් සහීහ් මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. හිරු උදාවන ශ්‍රේෂ්ඨතම දිනය වනුයේ ජුමුආ දිනයයි. ආදම් මවනු ලැබුවේ එහිය. ස්වගර්යට ප්‍රවේශ කරනු ලැබුවේ ද එදිනයි. ඉන් බැහැර කරනු ලැබුවේ ද එදිනයි.

මිනිසාගේ මැවීම සම්බන්ධයෙන් අල්ලාහ් මෙනෙහි කරමින් මෙසේ පවසා සිටියි:﴿وَلَقَدۡ خَلَقۡنَا ٱلۡإِنسَـٰنَ مِن سُلَـٰلَةٍ مِّن طِينٍ" සැබැවින්ම අපි මැටි සාරයෙන් මිනිසා මැව්වෙමු.ثُمَّ جَعَلۡنَـٰهُ نُطۡفَةً فِى قَرَارٍ مَّكِينٍ පසු ව අපි ඔහු සුරක්ෂිත ස්ථානයක ශුක්‍රාණුවක් ලෙස තැන්පත් කළෙමු. ثُمَّ خَلَقۡنَا ٱلنُّطۡفَةَ عَلَقَةً فَخَلَقۡنَا ٱلۡعَلَقَةَ مُضۡغَةً فَخَلَقۡنَا ٱلۡمُضۡغَةَ عِظَـٰمًا فَكَسَوۡنَا ٱلۡعِظَـٰمَ لَحۡمًا ثُمَّ أَنشَأۡنَـٰهُ خَلۡقًا ءَاخَرَۚ فَتَبَارَكَ ٱللَّهُ أَحۡسَنُ ٱلۡخَـٰلِقِينَ﴾ පසු ව අපි එම ශුක්‍රාණු ව එල්ලී පවතින ලේ කැටියක් බවට නිමර්ාණය කළෙමු. පසු ව එම එල්ලී පවතින ලේ කැටිය මස් ගොබක් බවට නිමර්ාණය කළෙමු. පසු ව එම මස් ගොබ අස්ථි බවට නිමර්ාණය කළෙමු. පසු ව අපි එම අස්ථි මසින් ඇන්දෙව්වෙමු. පසු ව අපි ඔහු ව වෙනත් මැවීමක් ලෙසින් බිහි කළෙමු. එහෙයින් උත්පාදකයින්ගෙන් වඩාත් අලංකාර වූ අල්ලාහ් අති උත්කෘෂ්ට විය.(අල්-මුඃමිනූන්: 12-14)

තව ද අල්ලාහ් මෙසේ ද පවසා සිටියි:﴿يَـٰٓأَيُّهَا ٱلنَّاسُ ٱتَّقُواْ رَبَّكُمُ ٱلَّذِى خَلَقَكُم مِّن نَّفۡسٍ وَٰحِدَةٍ وَخَلَقَ مِنۡهَا زَوۡجَهَا وَبَثَّ مِنۡهُمَا رِجَالًا كَثِيرًا وَنِسَآءًۚ وَٱتَّقُواْ ٱللَّهَ ٱلَّذِى تَسَآءَلُونَ بِهِۦ وَٱلۡأَرۡحَامَۚ إِنَّ ٱللَّهَ كَانَ عَلَيۡكُمۡ رَقِيبًا﴾ අහෝ මිනිසුනි! නුඹලා නුඹලාගේ පරමාධිපතිට බිය බැතිමත් වනු. ඔහු වනාහි නුඹලාව එක ම ආත්මයකින් නිමර්ාණය කළේය. තවද එහි සහකාරිය ද ඉන් නිමර්ාණය කළේය. ඒ දෙදෙනාගෙන් අධික වශයෙන් පිරිමින් හා ගැහැණුන් ව්‍යාප්ත කළේය. තවද නුඹලා එකිනෙකා කවර කරුණක (අයිතියක්) ඉල්ලා සිටින්නේ ද ඒ ගැන ද ලේ ඥාතීත්වය (බිඳ දැමීම) ගැන ද අල්ලාහ්ට බිය වනු. නියත වශයෙන් ම අල්ලාහ් නුඹලා කෙරෙහි සවර් නිරීක්ෂකයා විය.(අන්-නිසා: 1)

මෙම පාඨවල මිනිසාගේ මැවීමේ ආරම්භයේ සිට ඔහු අවසානයට ගමන් ගන්නා ස්ථානය දක්වා වූ ඔහුගේ අදියරයන් හා ඔහුගේ

විතැන් වීම් ගැන අල්ලාහ් මෙනෙහි කළේය. මිනිස් වගර්යාගේ ආරම්භ මැවීම ආදම් අලයිහිස් සලාම් බව මෙනෙහි කළේය. සැබැවින්ම ඔහු මැටි සාරයෙන් මවනු ලැබීය. එනම් මහපොළොවේ සියලුම තැන්වලින් ගනු ලැබූ මැටි සාරයයි. එබැවින් ඔහුගේ දරුවන් භූමියේ ප්‍රමාණයට අනුව සිටිති. ඔවුන් අතරින් දැහැමි අය මෙන්ම දුෂ්ඨ අය ද සිටින අතර පහසුකම් ඇති හා දුක් සහිත අය ද සිටිති.

අහස් හා මහපොළොවේ හා ඒ දෙක අතර ඇති දෑහි මැවීම සම්බන්ධයෙන් අල්ලාහ් මෙසේ මෙනෙහි කරයි:﴿خَلَقَ ٱلسَّمَٰوَٰتِ بِغَيۡرِ عَمَدٖ تَرَوۡنَهَاۖ وَأَلۡقَىٰ فِي ٱلۡأَرۡضِ رَوَٰسِيَ أَن تَمِيدَ بِكُمۡ وَبَثَّ فِيهَا مِن كُلِّ دَآبَّةٖۚ وَأَنزَلۡنَا مِنَ ٱلسَّمَآءِ مَآءٗ فَأَنۢبَتۡنَا فِيهَا مِن كُلِّ زَوۡجٖ كَرِيمٍ﴾ "නුඹලා එය දකින අයුරින් කිසිදු කුලුණකින් තොර ව අහස් ඔහු මැව්වේය. තවද (භූමිය) නුඹලා සමඟ නොසැළී සිටීම පිණිස මහපොළොවේ ඔහු කඳු ඇති කළේය. තවද එහි සෑම ජීවියකුම ව්‍යාප්ත කළේය. තවද අපි අහසින් ජලය පහළ කොට එහි යහපත් සෑම ජෝඩුවකින්ම පැළෑටි හටගැන්වූයෙමු."(ලුක්මාන්: 10)අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ ඥාතීන් හා එතුමාණන්ගේ මිතුරන් සෑම දෙනාටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

ඒකාබද්ධිත අංකය: 3200

ඉස්ලාම් ගැන නිතර අසන ප්‍රශ්න: ශබ්දකෝෂයෙන් තෝරාගත් ප්‍රශ්න. ....................1

(මැවීම පිළිබඳ කොටස) ....................1

ජීවිතය ආරම්භ වූයේ කෙසේ ද? ....................1